සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය

நலன்புரி நன்மைகள் சபை

WELFARE BENEFITS BOARD

මුදල්, ආර්ථික ස්ථායීකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය

நிதி, பொருளாதார உறுதிப்பாடு மற்றும் தேசியக் கொள்கைகள் அமைச்சு

Ministry of Finance, Economic Stabilaization & National Policies

මහලේකම් කාර්යාලය, කොළඹ 01, ශ්‍රී ලංකාව. | செயலகம், கொழும்பு 01, இலங்கை. | The Secretariat, Colombo 01, Sri Lanka.


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல<br>My No. | MF/WBB/02/Notice/D/Div.S./2022 | ඔබේ අංකය<br>உமது இல<br>Your No | | දිනය<br>திகதி<br>Date | 2023.06. 27 |

සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන් හා ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත,

**සුබසාධක ප්‍රතිලාභ ගෙවීම් ලැබීම පිණිස සුදුසු තැනැත්තන්/ පවුල් හඳුනා ගැනීම -2022 වැඩසටහන අභියාචනා හා විරෝධතා පරීක්ෂණ ක්‍රියාවලිය පිළිබඳ වැඩිදුර උපදෙස්**

දිස්ත්‍රික් ලේකම්වරුන් හා විශේෂයෙන්ම ප්‍රාදේශීය ලේකම්වරුන් සමඟ කළ අදහස් හුවමාරු කර ගැනීමේ සාකච්ඡාවලදී යෝජනා කළ පරිදි අස්වැසුම සුබසාධක ප්‍රතිලාභ වැඩසටහනේ සුදුසුකම්ලාභී නාමලේඛනය පදනම් කරගෙන අභියාචනා හා විරෝධතා කැඳවීම හා ඒවා පරීක්ෂා කිරීමේ ක්‍රියාවලියට අදාළව මෙයට පෙර නිකුත් කරන ලද උපදෙස්වලට අමතර වශයෙන් මෙම උපදෙස් එවනු ලැබේ.

1. අභියාචනා හා විරෝධතා ඉදිරිපත් කිරීම සඳහා ලබාදී තිබූ කාලය 2023.07.10 දින දක්වා දීර්ඝ කිරීමට සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය තීරණය කර ඇත.අභියාචනා හා විරෝධතා ඉදිරිපත් කිරීම දිරිගැන්වීම සඳහා පහත සඳහන් පරිදි ක්‍රියාකිරීමටද තීරණය කර ඇත.

   i. අභියාචනා හා විරෝධතා කැඳවීමේ අවසන් දිනය දීර්ඝ කිරීම සහ ප්‍රාදේශීය ලේකම් භාවිතා කළයුතු අභියාචනා හා විරෝධතා ඉදිරිපත් කිරීමේ ආකෘතිපත්‍රය මහජනයාට දැනගැනීම සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල හා ග්‍රාමනිලධාරී කාර්යාලවල දැන්වීම් මඟින් ප්‍රචාරයක් ලබාදීම සඳහා අවශ්‍ය පියවර ගන්න.

   ii. ජාතික හැඳුනුම්පත් අංකය ඇතුළත් කර පරිගණක පද්ධතියට ඇතුල්වීම විරෝධතා ඉදිරිපත් කිරීමට අමතරව පුද්ගලයකුට අවශ්‍ය නම් හඳුන්වා දී ඇති ආකෘති පත්‍රය මඟින් විරෝධතාවයක් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට නිර්නාමිකව වුවද භාරදිය හැකියි. ඒ අනුව එය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නිලධාරීන් විසින් පරිගණක පද්ධතියට ඇතුළත් කළ හැකියි. එවැනි විරෝධතා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ලියාපදිංචි කරගෙන ඊට අංකයක් ලබාදිය යුතු අතර එම විරෝධතා පසු අවස්ථාවකදී පරිශීලනය කළහැකි පරිදි ගොනුකර තබාගත යුතුයි.

2. අභියාචනා හා විරෝධතා පිළිබඳ පරීක්ෂණ පවත්වා ඉක්මණින් තීරණ ලබාදීම සඳහා අභියාචනා කමිටු මඟින් පහත සඳහන් කරුණු සැලකිල්ලට ගත යුතුයි.

   i. අභියාචනා කමිටුව වෙත ඉදිරිපත් වූ අභියාචනා අතුරින් දත්තවල වෙනසක් ඇති බව සඳහන් කර නැති එනම් යම් සටහනක් මඟින් තමන් සුදුසුකම් ලබා ඇති බවට පමණක් අභියාචනා කර ඇති ඉල්ලීම් වෙනම තෝරාගෙන ඒ සම්බන්ධයෙන් පොදු තීරණ ගත හැකියි.

ii. අභියාචනා හා විරෝධතා පරීක්ෂා කිරීමේදී වැඩිදුරටත් තොරතුරු පරීක්ෂා කර තහවුරු කරගැනීම සඳහා ග්‍රාම නිලධාරීන් වෙනත් ක්ෂේත්‍ර නිළධාරීන් හෝ තේරීම් කමිටුවේ නිලධාරීන් යොදා ගත හැකිය. එසේ නොමැති නම් ඉදිරිපත් කර ඇති තොරතුරු සනාත කිරීම සඳහා අදාළ ලියකියවිලි ලබාගෙන අභියාචනා කමිටුව විසින් තීරණ ගත හැකියි.

iii. ප්‍රාදේශීය ලේකම්වරුන් විසින් තේරීම් ක්‍රියාවලියේදී අයදුම්පත්වල යම් නිරීක්ෂණ සඳහන් කර ඇත්නම් ඒවාද අභියාචනා කමිටුවේ සැලකිල්ලට භාජනය කළ හැකියි.

iv. පරිගණකය මගින් ලකුණු ක්‍රමය අනුව තෝරාගැනීම සඳහා දත්ත යොදා ගැනීමෙන් පසුව පද්ධතිය තුළට එකතු වූ ප්‍රාදේශීය ලේකම් අනුමත කළ දත්තවලට අදාළ අයදුම්පත් සම්බන්ධයෙන් අභියාචනා ඉදිරිපත් කිරීමට සලස්වා අභියාචනා කමිටුව විසින් තීරණ ගත හැක.

v. අයදුම්කර තිබුණද සංගණනයට භාජනය නොවූ අයදුම්පත් සහ තාක්ෂනික ගැටළු හේතුවෙන් දත්ත අස්ථානගත වූ අයදුම්පත් ඇත්නම් ඒවා සංගණනයට ලක් කරවා තේරීම් ක්‍රියාවලියවලියට සම්බන්ධ කර තීරණ ලබාදීම සඳහා සැලකිල්ලට ගත හැකියි.

vi. අභියාචනා හා විරෝධතා පරීක්ෂාකර ඉක්මනින් තීරණ ලබාදීම සඳහා ඒවා ලැබෙන අවස්ථාවේ සිටම අභියාචනා කමිටු විසින් තම කටයුතු ආරම්භ කර ක්‍රියා කළ හැකියි. තවද රජයේ නිවාඩු දින ද එම කටයුතු සඳහා යොදා ගැනීමට පියවර ගන්න.

vii. අභියාචනා කමිටුවල කටයුතු සාර්ථක කර ගැනීම සඳහා අදාළ තේරීම් කමිටුවේ සභාපතිවරයා ද අභියාචනා කමිටුවට සහභාගි කරවා ගැනීම සුදුසු බව අවධාරණය කරමි.තවද අභියාචනා හා විරෝධතා කමිටුවල තීරණ අවසානාත්මක තීරණ විය හැකි බැවින් නිවැරදි ප්‍රතිඵල ලබා ගැනීමට ක්‍රියා කළ යුතුයි.

viii. අභියාචනයක් හෝ විරෝධතාවයක් ඉදිරිපත් කළවිට එය ලැබුණු බවට පණිවිඩයක් අභියාචනාකරුට/ විරෝධතාකරුට යැවීමට පියවර ගන්න.

3. අභියාචනා හා විරෝධතා සම්බන්ධයෙන් අභියාචනා කමිටුවේ තීරණය පරිගණක පද්ධතියේ නිශ්චිතව සඳහන් කිරීමට කමිටු සභාපතිවරුන් විසින් පියවර ගත යුතුයි. ඒ අනුව එම තීරණය සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය විසින් ලබාගෙන පුද්ගලයින්ට පිළිතුරු යැවීම සඳහා ඉදිරි පියවර ගනු ලැබේ.

4. අභියාචනා මණ්ඩලයේ තීරණ පදනම් කරගෙන සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය විසින් සුදුසුකම්ලාභී ලේඛනයන් ඉවත් කිරීම හෝ සුදුසුකම්ලාභී වර්ගය වෙනස් කිරීම හෝ සිදු කරනු ඇත.

එමෙන්ම සුබසාධක ප්‍රතිලාභ වැඩසටහන ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් ඔබගෙන් ලැබෙන සහයෝගය ඉතා අගය කොට සලකමි.

බී. විජයරත්න
සභාපති/කොමසාරිස්